# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2336/46 - 2023 ජූනි මස 14 වැනි බදාදා - 2023.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 15/2014 (II)

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 43 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 57 වන වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සාදනු ලබන රීති.

සභාපති,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.
(සඳහා සහ වෙනුවෙන්).

2023 ජනවාරි මස 16 වැනි දින
කොළඹ දී ය.

**රීති**

1. මේ රීති 2023 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (ආනයනකරුවන්ගේ, නිෂ්පාදකයන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නාමාවලිය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ආනයනකරුවන්ගේ, නිෂ්පාදකයන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නාමාවලියක් පවත්වාගෙන යෑමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ සෑම ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපාංග ආනයනකරුවකු, නිෂ්පාදකයකු, හෝ සැපයුම්කරුවකු විසින් ම (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි තොරතුරු ද සමග, අවස්ථාවෝචිත පරිදි, එකී ආනයනකරුවා, නිෂ්පාදකයා හෝ සැපයුම්කරුවා අධිකාරියේ ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.


1A - G 39702— 26 (2023/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. 2 වන රීතිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, ආනයනකරුවකු, නිෂ්පාදකයකු හෝ සැපයුම්කරුවකු ලියාපදිංචි කිරීම සඳහා වන නිර්ණායක මේ රීතිවල පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

4. අවස්ථාවෝචිත පරිදි, ආනයනකරුවකු, නිෂ්පාදකයකු හෝ සැපයුම්කරුවකු වශයෙන් අධිකාරියේ ලියාපදිංචි වූ යම් තැනැත්තකු වෙත, මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ලියාපදිංචි කිරීමේ ගාස්තුව ගෙවීමෙන් පසුව, ලියාපදිංචි කිරීමේ අංකයක් ලබා දී අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි වූ ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එම සහතිකය එහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

5. මේ රීති යටතේ අධිකාරියේ ලියාපදිංචි වූ අවස්ථාවෝචිත පරිදි, සෑම ආනයනකරුවකුම, නිෂ්පාදකයකුම හෝ සැපයුම්කරුවකුම, එම ලියාපදිංචියෙහි කාලසීමාව ඉකුත් වන දිනට පෙරාතුව, 4 වන රීතිය යටතේ නිකුත් කරන ලද සහතිකය අලුත් කිරීම සඳහා මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අලුත් කිරීමේ ගාස්තුව ද සමග අධිකාරිය වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

6. මේ රීති යටතේ අධිකාරියේ ලියාපදිංචි වූ අවස්ථාවෝචිත පරිදි, සෑම ආනයනකරුවකුම, නිෂ්පාදකයකුම හෝ සැපයුම්කරුවකුම, අධිකාරිය විසින් මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එකී ආනයනකරුගේ, නිෂ්පාදකයාගේ හෝ සැපයුම්කරුවාගේ කාර්ය සාධනය මත ශ්‍රේණිගත කළ යුතු ය.

## පළමුවන උපලේඛනය

### ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා වන නිර්ණායක

1. අපේක්ෂිත ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවකු, නිෂ්පාදකයකු සහ සැපයුම්කරුවකු (IMS) –

(අ) අධිකාරියේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලැබීම සඳහා, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සමග හෝ ව්‍යාපාර නාම ආඥාපනත හෝ පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්ති යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක හෝ ලියාපදිංචි වී සිටිය යුතු ය.

(ආ) ශ්‍රී ලංකා රජය විසින් අවසාන අවුරුදු තුන ඇතුළත අසාදුගත කරන ලද හෝ ක්‍රියාකාරිත්වය අත්හිටුවන ලද යම් ලැයිස්තුවක ඇතුළත් නොවිය යුතු ය.

(ඇ) අයදුම් කරන අවස්ථාවේ නෛතිකව බුන්වත් හෝ බංකොලොත් ලෙස ප්‍රකාශයට පත් නොකොට තිබිය යුතු ය.

2. (1) පහත සඳහන් මූලික ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්හි නියැලෙන ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් පහත කාණ්ඩ තුන අතරින් එකක් හෝ කිහිපයක් යටතේ ලියාපදිංචි කළ යුතු යː-

(අ) ආනයනකරු (IM) - ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්.

(ආ) නිෂ්පාදකයා (M) - තමාගේම ආයතන තුළ ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග නිෂ්පාදකයන්.

(ඇ) සැපයුම්කරු (S) - ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග සැපයුම්කරුවන්.

(2) ක්‍රියාකාරී ක්ෂේත්‍ර එකක ට වඩා වැඩි සංඛ්‍යාවක නියැලීමට අපේක්ෂා කරන ආනයනකරුවකු, නිෂ්පාදිතයකු සහ සැපයුම්කරුවකු එම එක් එක් කාණ්ඩයට අදාළ ලියාපදිංචි ගාස්තු ගෙවා වෙන වෙනම අධිකාරියෙහි ලියාපදිංචිය ලබා ගත යුතු ය.

3. ලියාපදිංචි කිරීමේ කාර්යපටිපාටිය පහත පරිදි විය යුතු යː-

(අ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අදාළ වන ලේඛන සහ මෙම උපලේඛනයෙහි 4.2 වන උපඡේදයේ නිශ්චිතව දක්වා ඇති ඇගයීමේ ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා සහාය වන අදාළ ලේඛන සැකසුම් ගාස්තු ද සමග අධිකාරියේ තොරතුරු මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

(ආ) සියලු ලේඛන පිළිවෙළට පවතී නම්, සුපරීක්ෂා කිරීම සහ අනුමතය ලබාදීම සඳහා (අයදුම්පත ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත) අගයන ලද අයදුම්පත ලියාපදිංචි කිරීමේ මණ්ඩලය වෙත යවනු ලැබේ.

(ඇ) ශ්‍රේණිගත කිරීම සඳහා වන ඇගයීමේ ක්‍රියාවලිය 4 වන ඡේදයේ දක්වා ඇති පටිපාටිය අනුව සිදු කරනු ලැබේ.

(ඈ) අයදුම්පත සම්බන්ධයෙන් කටයුතු කිරීමෙන් සහ ශ්‍රේණිය තහවුරු කිරීමෙන් පසුව, ඉල්ලුම්කරු වෙත ලියාපදිංචි අංකයක් ලබාදෙන අතර, දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ලියාපදිංචි ගාස්තුව ගෙවීමෙන් පසුව, ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබේ.

(ඉ) එකී ලියාපදිංචිය, සහතිකයෙහි නිශ්චිතව දක්වා ඇති කාලසීමාව සඳහා වලංගු විය යුතු අතර, තත්ත්ව/පරීක්ෂණ වාර්තා වාර්ෂික සමාලෝචනය කිරීමකට, විගණන ප්‍රකාශයන්ට සහ වාර්ෂික ලියාපදිංචි ගාස්තුව ගෙවීමකට යටත්ව වාර්ෂික පදනම මත අලුත් කළ යුතු වේ.

(ඊ) ලියාපදිංචිය සහ ශ්‍රේණිගත කිරීම වලංගු කාලසීමාව ඉකුත්වීමට මාසයකට පෙරාතුව අධිකාරියේ සෝදිසි කිරීමේ කණ්ඩායමක් විසින් කාර්ය සාධන තක්සේරුවක් කිරීමෙන් පසුව අලුත් කළ යුතු ය.

(උ) අධිකාරියෙහි තබා ඇති පුස්තිකාවන්හි ලැයිස්තුගත කර ඇති පරිදි බහුවිධ ආනයන, නිෂ්පාදන සහ සැපයුම් වර්ගයන්හි ලියාපදිංචි වීම සඳහා අයදුම් කරන්නා වූ ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් විසින් අදාළ ලේඛන ද සමග වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. එසේ වුව ද, අයදුම්පතෙහි ඇති අදාළ ආනයනය, නිෂ්පාදනය හෝ සැපයුම සඳහා වෙනස් සන්නාමයන් ඇතුළත් වන්නේ නම්, එකී සියලු සන්නාමයන් අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර ලියාපදිංචිය එකී සන්නාමයන් සම්බන්ධව පමණක් විය යුතු ය.

(ඌ) ලියාපදිංචිය ඉකුත් වී ඇති අවස්ථාවක දී, නව අයදුම්පතක් ඉදිරිපත් කිරීම මගින් නැවත ලියාපදිංචිය ලබාගත හැකි ය. ලියාපදිංචිය අතීතයට බලපැවැත්වෙන පරිදි නැවත වලංගු කිරීම නොකරනු ලැබේ.

4. ශ්‍රේණිගත කිරීම

4.1 ශ්‍රේණිගත කිරීමේ නිර්ණායක

නියමිත ආනයන, නිෂ්පාදන සහ සැපයුම් සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් මූලික මට්ටම් තුනකට ශ්‍රේණිගත කළ යුතු ය. එකී ශ්‍රේණිගත කිරීම සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ පද්ධතිය (IMSRS) විසින් ඉදිකිරීම් ද්‍රව්‍ය සහ උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන්ගේ කාර්ය සාධන ඇගයීම සැලකිල්ලට ගනු ලැබේ. කාර්ය සාධන මට්ටම පහත සඳහන් "කාර්ය සාධන දර්ශක" මත මනිනු ලැබේ:-

(අ) ගුණාත්මකභාවය;

(ආ) ව්‍යාපාර හැකියාව;

(ඇ) මූල්‍ය හැකියාව.

"මුළු ලකුණු සහ ඇගයීමේ ප්‍රධාන ක්ෂේත්‍ර" යන ශීර්ෂය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති (ඈ) වන වගුවේ සිට (ඉ) වන වගුව දක්වා දී ඇති කාර්ය සාධන දර්ශක සඳහා (ආ) වන වගුවේ දී ඇති බරතැබීම්වලට අනුව ශ්‍රේණිගත කිරීම සඳහා වන ලකුණු වෙන් කරනු ලැබේ. අවම මුළු ලකුණු සංඛ්‍යාව ඉහත කී ශීර්ෂය යටතේ (අ) වන වගුවේ දී ඇති ලකුණු වගුව පරිදි වේ.

4.2 මුළු ලකුණු සහ ඇගයීම් ප්‍රධාන ක්ෂේත්‍ර

**(අ) වන වගුව: අවශ්‍ය අවම මුළු ලකුණු සංඛ්‍යාව**

| *ශ්‍රේණිය* | *අවම මුළු ලකුණු සංඛ්‍යාව* |
|---|---|
| IM/M/S - 1 | 75 |
| IM/M/S- 2 | 30 |
| IM/M/S- 3 | 5 |

**(ආ) වන වගුව: ඉදිකිරීම් ද්‍රව්‍යවල ඇගයීම් සඳහා වන බරතැබීම්**

| *කාර්ය සාධන දර්ශකය* | *බරතැබීම %* |
|---|---|
| 1. ගුණාත්මකභාවය | 50 |
| 2. ව්‍යාපාර හැකියාව | 30 |
| 3. මූල්‍ය හැකියාව | 20 |

**(ඇ) වන වගුව: ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මකභාවය**

| නිර්ණායකය | මුළු ලකුණු (100) | |
|---|---|---|
| | වැලි, පස් සහ පතල් නිස්සාරණ ආදී අයිතම හැර | වැලි, පස් සහ පතල් නිස්සාරණ ආදී අයිතම |
| 1. ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) සහතික කරන ලද | 45 | 20 |
| (හෝ පිළිගත් අන්තර්ජාතික ප්‍රමිතීන්ට පමණක් සහතික කරන ලද) | (30) | (10) |
| 2. ශ්‍රී ලංකා ප්‍රමිති (SLS) අනුව නිෂ්පාදනය කරන ලද | 15 | 20 |
| (හෝ පිළිගත් අන්තර්ජාතික ප්‍රමිතීන්ට පමණක් නිෂ්පාදනය කරන ලද) | (10) | (10) |
| 3. පද්ධති සහතිකය | 25 | 5 |
| 4. අභ්‍යන්තර පරීක්ෂණ පහසුකම් | 10 | 5 |
| 5. පවතින ප්‍රමිති සපුරාලන පරිදි පරීක්ෂණ වාර්තා සැපයීමේ හැකියාව | 5 | 50 |

**(ඈ) වන වගුව: ව්‍යාපාර හැකියාව**

| *නිර්ණායකය* | *මුළු ලකුණු (100)* |
|---|---|
| 1. සේවා වාර්තා<br>1.1 දෙන ලද ඉදිකිරීම් ද්‍රව්‍යයක් හෝ උපාංගයක් සඳහා අවුරුදු 2 කට වඩා සේවා කාලයක් සපුරා තිබීම | 60 |
| 1.2 දෙන ලද ඉදිකිරීම් ද්‍රව්‍යයක් හෝ උපාංගයක් සඳහා අවුරුදු එකේ සිට දෙක දක්වා | (40) |
| 1.3 අවුරුද්දකට වඩා අඩු | (20) |
| 2. පසුගිය අවුරුදු 03 ඇතුළත විකුණුම් ප්‍රමාණය - සාමාන්‍ය වාර්ෂික විකුණුම් ශ්‍රී ලංකා රුපියල් මිලියන | |
| 2.1 5.0 ට වැඩි | 40 |
| 2.2 1.0 සහ 5.0 අතර | 30 |
| 2.3 1.0 ට අඩු | 15 |

**(ඉ) වන වගුව: මූල්‍ය හැකියාව**

| *නිර්ණායකය* | *මුළු ලකුණු (100)* |
|---|---|
| 1.0 විගණන වාර්තා පැවතීම | |
| 1.1 පසුගිය වර්ෂ 03 සඳහා (සම්පූර්ණ) | 30 |
| 1.2 ආසන්නතම පසුගිය වර්ෂය | 20 |
| 1.3 ආසන්නතම පසුගිය වර්ෂයට පෙර වාර්තා | 5 |
| 2.0 විගණන වාර්තා මත පදනම්ව වාර්ෂික පිරිවැටුම | |
| 2.1 මිලියන 10 ට වැඩි | 35 |
| 2.2 මිලියන 4 සිට මිලියන 10 දක්වා | 20 |
| 2.3 මිලියන 1 සිට මිලියන 4 දක්වා | 10 |
| 3.0 මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ධනාත්මක ශුද්ධ වටිනාකම (විගණන වාර්තා මත පදනම්ව) | |
| 3.1 50% ට සමාන හෝ ඊට වැඩි | 35 |
| 3.2 50% සිට 25% දක්වා | 20 |
| 3.3 25% සිට 10% දක්වා | 10 |

*සටහන්:*

(1) (ආ) සහ (ඇ) සිට (ඉ) වගුවල පිළිවෙළින් සඳහන් බරතැබීම් හා ලකුණු දීමේ නිර්ණායක මත පදනම්ව සුදුසු පරිදි (අ) වගුවේ සඳහන් මුළු ලකුණු වෙන් කරනු ලැබේ.

(2) (ඇ) වගුවේ ව්‍යාපාර හැකියාව නිර්ණායකය ප්‍රමාණ මත පදනම් වන අතර, සත්‍යායනය කිරීම සඳහා සහායක ලේඛන අවශ්‍ය වේ.

(3) (ඇ) වගුවේ ඉදිකිරීම් ද්‍රව්‍ය අවම වශයෙන් එහි ලැයිස්තු ගත කර ඇති ගුණාත්මක නිර්ණායක එකකින් හෝ සනාථ කිරීම අවශ්‍ය වේ.

ලැයිස්තුගත කර ඇති එක් එක් ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා අනිවාර්ය වන ගුණාත්මක නිර්ණායක අධිකාරිය විසින් පළකර ඇති පුස්තිකාවෙහි දක්වා ඇත.

(4) ඉහත සඳහන් (ඇ) සිට (ඉ) දක්වා වන වගුවල සඳහන් කර ඇති ලකුණු, දෙන ලද නිර්ණායකයක් සඳහා ලබා ගත හැකි වන උපරිම ලකුණු වේ.

(5) (ඇ) වගුවෙහි වරහන් තුළ දී ඇති ලකුණු විකල්පයන් වේ.

(6) (ඇ) සිට (ඉ) දක්වා වගුවල සඳහන් අයිතමයන්ට අදාළ සනාථ කිරීමේ ලේඛන ඇගයීමේ කාර්යය සඳහා අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**දෙවන උපලේඛනය**

**ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ඉදිකිරීම් උපාංග ආනයනකරුවන්, නිෂ්පාදකයන් සහ සැපයුම්කරුවන් ලියාපදිංචිය, ලියාපදිංචිය අලුත් කිරීම හෝ ලියාපදිංචිය ඉහළ දැමීම සඳහා වන ගාස්තු**

1. රු. 1000.00 ක අයදුම්පත සැකසීමේ ගාස්තුවක් සෑම ශ්‍රේණියක් සඳහා ම අදාළ වේ.

2. විවිධ ශ්‍රේණි සඳහා ලියාපදිංචි වීමේ, ලියාපදිංචිය අලුත් කිරීමේ සහ ඉහළ දැමීමේ ගාස්තු 1 සහ 2 වන වගුවල සඳහන් වේ.

*1 වගුව:* **සැපයුම්කරුවන් සඳහා වන ශ්‍රේණි සඳහා ලියාපදිංචි වීමේ, ලියාපදිංචිය අලුත් කිරීමේ හෝ ඉහළ දැමීමේ ගාස්තුව**

| *ශ්‍රේණිය සහ අදාළ සැපයුම්කරු කාණ්ඩය* | *වාර්ෂික ගාස්තුව (රුපියල්, එකතු කළ අගය මත බදු හැර)* |
|---|---|
| S - 1 | 22,000.00 |
| S - 2 | 18,000.00 |
| S - 3 | 15,000.00 |

**2 වගුව: ආනයනකරුවන්, නිෂ්පාදකයන් සඳහා වන ශ්‍රේණි සඳහා ලියාපදිංචි වීමේ, ලියාපදිංචිය අලුත් කිරීමේ හෝ ඉහළ දැමීමේ ගාස්තුව.**

| *ශ්‍රේණිය සහ අදාළ ආනයනකරු, නිෂ්පාදක කාණ්ඩය* | *වාර්ෂික ගාස්තුව (රුපියල්, එකතු කළ අගය මත බදු හැර)* |
|---|---|
| IM/M - 1 | 40,000.00 |
| IM/M - 2 | 36,000.00 |
| IM/M - 3 | 30,000.00 |

3. විශේෂ අවස්ථානුගත කරුණු යටතේ එක් එක් අයදුම්පත සම්බන්ධයෙන් හදිසියේ කටයුතු කිරීම සඳහා රු. 5,000.00 ක අමතර ගෙවීමක් අයකරනු ලැබේ.

4. ලියාපදිංචිය අලුත් කිරීම සහ ඉහළ දැමීම සඳහා කාර්ය සාධනය ඇගයීමේ පිරිවැය, (අවශ්‍යවන අවස්ථාවල) එක් එක් අවස්ථාව සඳහා අධිකාරිය විසින් ගණනය කරනු ලැබේ. මෙම පිරිවැය අයදුම්කරු විසින් එසේ ලියාපදිංචිය අලුත් කිරීම හෝ ඉහළ දැමීමට පෙර ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

EOG 06 - 0105

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.